# ගුණාත්මක බීජ නිෂ්පාදනයට මී මැස්සන් සහාය කරගනිමු

*සුනිල් ගොවින්නගේ*
සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ හා රෝපණ ද්‍රව්‍ය) පැල්වෙහෙර/කන්තලේ කලාපය

**නූතන කෘෂිකර්මාන්තයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ, ඉතා ඉහල නිෂ්පාදන මට්ටමක් ඉතා කෙටි කාලයකදී ලබා ගැනීමයි . මේ සඳහා අවශ්‍ය කෘෂිකර්ම තාක්ෂණ මූලධර්ම අද ලෝකය දසත විසිරී ඇති අතර පැලෑටි සම්බන්ධ කායික විද්‍යාව, පස හා සම්බන්ධ පර්යේෂණ සොයාගැනීම් ශාඛ දෙමුහුම් කිරීම් හා ජාන පිළිබඳ විශේෂඥ දැනුම මේ අතර මුල් තැනක් ගනී. එහෙත්, මෙවැනි ම ඉතා ම වැදගත් වූ තවත් සාධකයක් අපගේ අවධානයට ලක්විය යුතුය ඒ ගුණාත්මක බීජ නිෂ්පාදනයට අවශ්‍ය " පරාගනය " පිළිබඳ දැනුමයි.**

බීජ වලින් තොර, කෘෂිකර්මාන්තයක් නොමැත. උද්භිද විද්‍යානුකූලව බීජයක් සෑදීමට නම් මල් හට ගැනීමක් සිදුවිය යුතුය. ගුණාත්මක බීජයක් ඇතිවීමට නම් එම හටගත් මල් පරාගනය සිදුවිය යුතුම යි. අප විසින් නොයෙකුත් තාක්ෂණික විද්‍යාත්මක ශිල්පීය ක්‍රම හා පර්යේෂණ උපයෝගී කර බෝග සංස්ථාපනය කර වැඩි අස්වැන්නක් රැස් කර ගත්ත ද, පුෂ්ප හටගත් අවධියේ දී සුදුසු පරිදි පරාගනය වී නොමැති නම් ඉන් අපට ජීව්‍යතාවයෙන් හෝ ගුණාත්මයෙන් යුත් බීජ නොලැබීයාමට පුළුවන. මෙයින් පෙනෙන්නේ පරාගනයේ ඇති වැදගත්කමයි. එනම් පරාගනය ගුණාත්මක බීජ නිෂ්පාදනයේ වැදගත් පියවරක් බවයි. අවාසනාවකට මෙන් අද ලංකාවේ පරාගනය සම්බන්ධව දක්වන සැළකිල්ල ඉතාම අල්පය. එබැවින් ඇමරිකාව, කැනඩාව සහ නෙදර්ලන්තය වැනි රටවල් බීජ නිෂ්පාදනයේ දී මෙ සම්බන්ධව දක්වන උනන්දුව ඉත්‍ාම ඉහළය.

උද්භිද විද්‍යානුකූලව සිතා බැලීමේ දී පැලෑටි වල පරාගනය තුන් ආකාරයකට සිදුවන බව පෙන්වා දී ඇත. ඇතැම් ශාඛ සුළඟින් ද, තවත් සමහරක් ජලයෙන් ද, බොහෝ ශාඛ කෘමීන් මගින් ද සමහර අවස්ථාවල ඉහත ක්‍රම සංයෝජනයෙන් ද සිදුවන බව වාර්තා වී ඇත. බොහෝ කෘෂිකාර්මික බෝග වල පරාගනය කෘමීන් මගින් සිදුවන බව සොයා ගෙන ඇති අතර, මී මැස්සන්ගෙන් සිදුවන සේවය අති මහත් බව වාර්තා වී ඇත . මී මැස්සා මගින් සිදුවන පරාගනයේ දී ගුණාත්මක ඵල හා බීජ ඇතිවීම පිළිබඳ කර ඇති පර්යේෂණ වාර්තා බොහොමයක් ඇති අතර විශේෂයෙන් පිපිඤ්ඤා කුළයේ බෝග වලදී මී මැස්සාට විශේෂ ස්ථානයක් හිමි වන බව පෙන්වා දී ඇත . එය කෙතරම් ද කිවහොත් මිනිස් ශ්‍රමය යොදා අතින් කරනු ලබන පරාගනය හා සමාන කාර්යක්ෂමතාවයකින් මී මැස්සා විසින් ද එම කාර්ය කර ඇති බවත් පර්යේෂණ මගින් සනාථ කොට ඇත .

යුරෝපයේ බොහෝ රටවල හා ඇමරිකානු රටවල බීජ නිෂ්පාදන ගොවිපලවල මී මැස්සාගේ සේවය ලබාගැනීම අනිවාර්යෙන්ම සිදු කෙරේ . එම ගොවිපලවල බීජ වගා ක්ෂේත්‍රවල විශාලත්වය අනුව මී මැසි සනාවාස තැන්පත් කිරීම පුෂ්ප හටගන්නා කාලවලදී සිදුකරනු ලබන අතර ඒ මගින් ගොවිපලවල නිෂ්පාදන බීජවල ගුණාත්මය ඉහළ තත්වයක පවත්වා ගෙන යයි . ඊට අමතරව මී මැසි නිෂ්පාදන වලින් ද අමතර ආදායම් ලබාගත හැකි බැවින් ගොවිපල ආදායම් ද ඉහළ යයි . කෙසේ වුවද බීජ ගොවිපලවල මී මැසි සනාවාස පිහිටුවීමේ අවාසි නැත්තේ ද නොවේ .එකම කුලයක වෙනත් ප්‍රභේද දෙකක් ඇති පරපරාගිත ශාඛ වගා කර ඇති විට වර්ග පාරිශුද්ධතාවය පාලනය කළ නොහැකි තත්වයකට පත්විය හැක . එසේ වුවද නියමිත දුර ප්‍රමාණ යොදා වගා සංස්ථාපනය කිරීම මගින් මෙවැනි ගැටළු මගහරවා ගත හැකි බව පෙන්වාදිය හැකි අතර, පරාගන කාර්‍යය සඳහා මී මැස්සන් යොදා ගැනීමේ ආර්ථික වාසිය මිනිස් දින වශයෙන් ගත්කළ දින 300 ක් පමණ වන බවද මෑතකදී කරන ලද පර්යේෂණයක් මගින් පෙන්වාදී ඇත .

ගොවිතැන රැකියාවක් වශයෙන් හෝ පුංචි ගෙවත්තක් හෝ කරනු ලබන වගාවකට වුවද, මී මැසි සනාවාසයක් මගින් ලබාගත හැකි වාසි සඳහා මෙයත් හොඳ නිදසුනක් නොවේ ද ? එමෙන් ම ගුණාත්මක බීජ නිෂ්පාදනයේ දී අත්‍යාවශ්‍යම සාධකයක් වන පරාගනය සලකන විට මී මැස්සාගෙන් සිදුවන සේවය ඉතා අගනා නොවන්නේද ?